අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112784846
isurupaya@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. } ED/05/67/01/පොදු VIII

ඔබේ යොමුව / உமது இல. / Your Ref. }

දිනය / திகதி / Date } 2022.06. 17

සියලුම පීඨාධිපතිවරුන් / ගුරු විද්‍යාල විදුහල්පතිවරුන්
සියලුම ජාතික පාසල් විදුහල්පතිවරුන්
ගුරු මධ්‍යස්ථාන කළමනාකරුවන්

<u>ප්‍රවාහන අපහසුතා හේතුවෙන් අනධ්‍යයන කාර්යමණ්ඩලයට සහන සැලසීම</u>

වර්තමානයේ උද්ගතව ඇති පොදු ප්‍රවාහන සේවා සාමාන්‍ය පරිදි ක්‍රියාත්මක නොවීම සහ පෞද්ගලිකව ඉන්ධන සපයාගැනීමේ අපහසුතාවය පිළිබඳව අවධානය යොමුකර සියලුම ජාතික පාසල් වල සේවයේ නියුතු අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා 2022.12.31 දින දක්වා හෝ නැවත වෙනත් නියමයක් කරන තුරු, යන අවස්ථා දෙකෙන් පළමුව එළඹෙන දිනය දක්වා රාජකාරි නිමකළ යුතු වේලාව ප.ව. 2.00 ලෙස සලකා කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

02. මෙහිදී පහත සඳහන් කරුණු කෙරෙහි ද අවධානය යොමුකළ යුතුය.

i. සේවා ස්ථානයෙන් බැහැර වීමට ප්‍රථම පැවරී ඇති රාජකාරි කටයුතු නිමකළ යුතු අතර උපරිම වශයෙන් මෙම සහනය අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ලබාදීමට හැකිවන පරිදි ආයතනය තුල ඒ සඳහා විධිමත් සැලැස්මක් සකස් කරගැනීමට විදුහල්පති විසින් කටයුතු කළ යුතුය.

ii. එසේම මෙම විධිවිධාන හේතුවෙන් ආයතනයේ සිදුකරනු ලබන දෛනික රාජකාරි කටයුතු සහ වෙනත් විශේෂ රාජකාරි කටයුතු සඳහා කිසිදු බාධාවක් නොවිය යුතුය.

iii. සේවා සහයක (ආරක්ෂක), අරක්කැමි, සහකාර ශිෂ්‍ය නිවාසාධිකාරි සහ ශිෂ්‍ය නිවාසාධිකාරි යන තනතුරුධාරීන් සඳහා මෙම විධිවිධාන අදාල නොවේ.

iv. මෙම විධිවිධාන පොදුවේ රජය විසින් හෝ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් ඉදිරියේදී ගනු ලබන තීරණයන්ට යටත්වේ.

03. තවද ආයතනයේ රාජකාරි කටයුතු සඳහා බාධාවක් නොවන පරිදි සැලසුම් කරගැනීමට යටත්ව අවශ්‍ය කාර්ය මණ්ඩලය වෙත සාමාන්‍ය රාජකාරි වෙලාවට පැයකට පෙර ඉහත 2 ඡේදයේ සඳහන් විධිවිධානයන්ට යටත්ව සේවා ස්ථානයෙන් බැහැරයාමට අවසර ලබාදීමට පීඨාධිපතිවරුන් / ගුරු විද්‍යාල විදුහල්පතිවරුන් / ගුරු මධ්‍යස්ථාන කළමනාකරුවන්හට බලය පවරනු ලැබේ.

එම්.එන්.රණසිංහ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් :
01. සියළුම අතිරේක ලේකම්වරුන් - අ.ක.ස.
02. ජාතික පාසල් අධ්‍යක්ෂක - අ.ක.ස.
03. විද්‍යාපීඨ කොමසාරිස් - අ.ක.ස.
04. අධ්‍යාපන අධ්‍යක්ෂ (ගුරු අධ්‍යාපන පරිපාලන) - අ.ක.ස.
05. සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් - අ.ක.ස.